සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டு இறுதிமதிப்பீடு - 2021
Year End Evaluation

| ශ්‍රේණිය / தரம் / Grade | 8 | විෂයය / பாடம் / Subject | ක්‍රිස්තියානි ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper | 1,2 | පැය / மணித்தியாலம் / Hours | 2 |
|---|---|---|---|---|---|---|---|

සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

1. දේව මැවිල්ලේ සෑම ක්‍රියාවක්ම සිදුවනුයේ,

   1. මිනිසාගේ කැමැත්තට අනුව  2. දේව සැලැස්මට අනුව

   3. ස්වභාව ධර්මයට අනුව  4. මේ සියල්ලටම අනුව

2. හොඳ නරක අවබෝධ කර ගැනීමේ ගස සංකේතවත් කරනුයේ

   1. ආත්මාර්ථකාමීත්වය  2. දේව කැමැත්ත  3. වෛරය  4. ප්‍රේමය

3. ජුදෙව් සමාජය තුළ ඉතාමත් අසරණ භාවයට පත් වූ ජන කණ්ඩායමක් වන්නේ

   1. දරුවන්  2. කාන්තාවන්  3. වැන්දඹුවන්  4. මහල්ලන්

4. දේව කැමැත්ත ඉටු කිරීම උදෙසා අප කළ යුතු වන්නේ

   1. සෑම ඉරිදාම පල්ලි යෑම  2. අප අවට පරිසරය පිරිසිදු කිරීම

   3. ප්‍රශංසා මෙහෙයන්ට සහභාගි වීම  4. දේව ගුණාංග ජීවිතයෙන් පෙන්වීම

5. හෙබ්‍රෙව් බසින් ''නබි'' යන වචනයෙන් හැඳින්වූයේ

   1. ප්‍රේරිතයන්  2. විනයධරයන්  3. දිවැසිවරුන්  4. රෝගීන්

6. දෙවියන් වහන්සේ තම ස්වරූපයෙන් හා සමානාත්මතාවයෙන් මිනිසා නිර්මාණය කලේ

   1. එය දේව කැමැත්ත නිසා  2. මිනිසාට ඇති අසීමිත ප්‍රේමය නිසා

   3. මිනිසා වටිනා කෙනෙකු යයි සිතු නිසා  4. දේවදූතයන්ගේ ස්වරූපය ගත් නිසා

7. ප්‍රේරිතයන් දොලොස් දෙනා කැඳවීම තුළ දක්නට ඇති විශේෂ ලක්ෂන 2 ක් ඇතුළත් පිළිතුර තෝරන්න

   A - ශ්‍රාවකයන් කැඳවීමට පෙර විමසිල්ලෙන් සිටීම

   B - ශ්‍රාවකයන් කැඳවීමට පෙර යාච්ඤා කිරීම

   C - ශ්‍රාවයකයන්ට පෙර පුහුණුවක් දී තෝරා ගැනිම

   D - විවිධ සමාජ පසුබිම් ඇති අය ශ්‍රාවකත්වයට කැඳවීම

   1. A D  2. B C  3. C D  4. B D

8. දේව මෙහෙවර උදෙසා කැප වීමෙන් 'තලාව' නම් ප්‍රදේශයේ සේවය තෝරා ගත්තේ

1. තෙරේසා මව්තුමිය 2. එලීසා ඇග්නිව්තුමිය 3. ජොයිස් ද සිල්වාතුමිය 4. ඉව්ලින් කානිතුමිය

9. ''මෙතැන් පටන් ඔබ මිනිසුන් දිනනු ඇත'' ජේසුස් වහන්සේ මෙසේ පැවසුවේ කාහටද?

1. ලෙවීටය 2. ජාකොබ්ටය 3. සීමොන්ටය 4. ජොහාන්ටය

10. ජේසුස් වහන්සේ තම මෙහෙවරට ශ්‍රාවකයින් කැඳවූයේ

1. තම ආරක්ෂාවට 2. මසුන් ඇල්ලීමට 3. මිනිසුන් දිනා ගැනීමට 4. උපදෙස් ලබා ගැනීමට

11. ගලීල මුහුද සඳහා යෙදෙන තවත් නාමයක් වන්නේ

1. රතු මුහුද 2. මළ මුහුද 3. මධ්‍යධරණී මුහුද 4. තිබේරියස් මුහුද

12. දෙවියන් වහන්සේ ආබ්‍රහම්ට දීමට පොරොන්දු වූ දේශය වන්නේ

1. මිසර දේශය 2. ජුදා දේශය 3.කානාන් දේශය 4. මෝවබ් දේශය

13. ජේසුස් වහන්සේ සීමොන් පේදුරුට භාරදුන් වගකීම් වන්නේ,

A - මාගේ බැටලු පැටවුන් පෝෂණය කරන්න

B - මාගේ බැටලුවන්ට ආදරය කරන්න

C - මාගේ බැටලුවන් නොමග නොයවන්න

D - මාගේ බැටලුවන්ගේ එඬේරා වන්න

1. A D 2. B C 3. A D 4. A B

14. දෙවියන් වහන්සේ මෝසෙස්ට කතා කරමින් ''මම නුඹලාට අහසින් ආහාර වස්වමි'' වදාළ සේක. මින් අදහස් වන්නේ

1. ඊශ්‍රායෙල් ජනයා රැකවරණයත් පෝෂණයත් ලද ආකාරයයි

2. ඊශ්‍රායෙල් ජනතාව දේව දඬුවමට ලක් වූ ආකාරයයි

3. ඊශ්‍රායෙල් ජනතාව ආහාර ප්‍රතික්ෂේප කළ බවයි

4. ඊශ්‍රායෙල් ජනතාව අහස දෙස බලා සිටි බවයි

15. ''යාච්ඤාවේ ගුරුවරිය'' ලෙස විරුදාවලිය ලබන මෑත කාලීන ධර්ම දූතිකාව වන්නේ,

1. ඉව්ලින් කානිතුමිය 2. තෙරේසා මව්තුමිය 3. එලීසා ඇග්නිව්තුමිය 4. ජොයිස් ද සිල්වාතුමිය

16. ''මොහුත් ආබ්‍රහම්ගේ පුත්‍රයෙකි යනුවෙන් ජේසුස් වහන්සේ පැවසුවේ කවුරුන් පිළිබඳ?

1. ජායිරස් පිළිබඳව 2. සාකෙවුස් පිළිබඳව 3. පේදුරු පිළිබඳ 4.පාවුල් පිළිබඳව

17. පැරණි ගිවිසුමේ සඳහන් නිවුන් සහෝදරයන් වන්නේ,

1.ඒසව් හා යාකොබ් 2. පේදුරු හා යාකොබ් 3. ඒසව් හා ඊසාක් 4. ඊසාක් හා පේදුරු

18. ඊශ්‍රායෙල් ජන සමාජයේ දේව මගපෙන්වීම ඇතිව නායකත්වය දැරූ දෙබෝරා,

1. විනිශ්චයකාරවරියකි ගෘහණියකි 2. දිවැසිවරියකි ගෘහණියකි

3. විනිශ්චයකාරවරියකි දිවැසිවරියකි 4. ගෘහණියකි ගුරුවරියකි

19. ''රෝගීන්ට මිස නීරෝගීන්ට වෙදාගෙන් කම්නැත'' ජේසු වහන්සේ මෙසේ පැවසුවේ,

1. ජොහාන් කැඳවීමේදී 2. මතෙව් කැඳවීමේදී 3. අන්ද්‍රෑ කැඳවීමේදී 4. සීමොන් කැඳවීමේදී

20 ඊශ්‍රායෙල් ජනතාව කාන්තාර ගමනේදී දේව කරුණාව හා පෝෂණය ලැබුවා සේ අපට අද දින එතුමා,

1. දේව ආරක්ෂාව හා ආශීර්වාද ලබා දෙයි 2. කරදර බාධක ඇති වුවත් දිවි ගෙවීමට සලසයි

3. නිරතුරුව නිතිපතා අවශ්‍ය ආහාර පමණක් ලබා දෙයි 4. භාහිර කරදරවලින් මුදවා ගනියි.

## දෙවන පත්‍රය

පළමු ප්‍රශ්නයට පිළිතුරු ලිවීම අනිවාර්ය වේ. ඉතිරි ප්‍රශ්න අතරින් හතරක් තෝරා පිළිතුරු සපයන්න. පිළිතුරු ලිවිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 5 කි.

1. 1. ''ප්‍රේරිත'' යන්නෙහි තේරුම ලියන්න

2. ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයන් අතර අයකැමියෙක් ලෙස ක්‍රියා කළ අයෙක් නම් කරන්න

3. ශුද්ධාත්ම ඵල දෙකක් ලියන්න

4. ආබ්‍රහම්ට දේව කැඳවීම ලැබුණේ කුමන ස්ථානයේද?

5. ආදී පීතෘ ආබ්‍රහම් තුළ දක්නට ඇති සුවිශේෂ ගුණාංග දෙකක් ලියන්න

6. ජේසුස් වහන්සේ කාන්තාවන් පිළිගෙන ක්‍රියා කළ අවස්ථාවකට උදාහරණයක් ලියන්න

7. ශුද්ධාත්ම මගපෙන්වීමෙන් සමාජය ආලෝකවත් කිරීමට ඔබට කළ හැකි ක්‍රියාමාර්ග දෙකක් ලියන්න

8. ශුද්ධාත්ම මගපෙන්වීමෙන් දෙව්මැදුරේදී ඔබට සේවය සඳහා ක්‍රියා කළ හැකි ආකාර දෙකක් ලියන්න

9. ජේසුස් වහන්සේ මරණය අභිබවා කළ ප්‍රාතිහාර්ය දෙකක් නම් කරන්න

10. කිතුනු දරුවකු වන ඔබ තුළ තිබිය යුතු යහපත් ගුණාංග දෙකක් ලියන්න

2 1. මෝසෙස් මිසරයේ වහල් කමෙන් ඊශ්‍රායෙල් සෙනග මුදවාගෙන එන විට ඔවුන් රැකවරණයත් දේව මග පෙන්වීමත් ලද ආකාරය ලියන්න

දිවා කාලයේ -................................................ රාත්‍රී කාලයේ -................................................

2. පාළුකරයේ දී දෙවියන් වහන්සේ ඊශ්‍රායෙල් ජනතාව පෝෂණය කළ ආකාරය ලියන්න

3. වර්තමාන සමාජයේ බොහෝ අය විවිධාකාර වහල් බැම් තුළ සිරවී සිටියි. ඊට උදාහරණ දෙකක් ලියා ඉන් මිදීමට පියවර ද ලියන්න

3. 1. හිස්තැන් පුරවන්න

වෙහෙසවන්නාවූ ........ ................ සියල්ලෙනි, ...... ......... ............ මා .......... ............... දෙන්නෙමි.

2. ජේසුස් වහන්සේ හමුවීමෙන් සහනය හා සුවය ලබා ගත් දෙදෙනෙකු නම් කරන්න

3. ඔබ ඇසුරු කරන සමාජයේ මිනිසුන් පීඩාවට ලක් වන ආකාර දෙකක් ලියා ඒ වෙනුවෙන් දෙවිඳුන්ගෙන් සහනය පතා යැදුමක් ලියන්න.

4. 1.ශුද්ධාත්ම දීමනා දෙකක් නම් කරන්න

2. ඔබේ පවුලේ හෝ සමාජයේ අයකු රෝගී වූ විට කරන යෙදුමක් ලියන්න

3. ඔබ ලබා ඇති දේව දීමනා දේව ගෞරවය හා මහිමය උදෙසා යොදා ගන්නා ආකාර තුනක් ලියන්න

5. 1. දෙවියන් වහන්සේ දේව මැවිල්ල සඳහා මිනිසා නිර්මාණය සඳහා යොදා ගනු ලැබුවේ මොනවාද? ජීවය ලැබුවේ කෙසේද?

2. දේව මැවිල්ල තුළ මිනිසාට පමණක් ලැබී ඇති අසමසම තත්ත්වයන් ලියන්න

3. ඔබගේ මිතුරා හෝ මිතුරිය වරදට පෙළඹෙන අවස්ථා දෙකක් හඳුනාගෙන ඉන් මිදීමට ඔබ ලබාදෙන උපදෙස් ලියන්න

6. 1. ගීතාවලිය 23 සඳහන් යහපත් බැටළු එඬේරාණන් තුළ දක්නට ඇති කාර්යභාරයන් දෙකක් ලියන්න

2. ජේසුස් වහන්සේ යහපත් බැටළු එඬේරා ලෙස ක්‍රියාකළ අවස්ථා 3ක් නම් කරන්න.

3. කිතුනු ඔබ නායකයකු ලෙස ක්‍රියා කරන විට ජේසුස් වහන්සේ ආදර්ශයට ගන්නා ආකාරය කරුණු පහකින් විස්තර කරන්න

7. පහත මාතෘකා අතරින් දෙකක් පිළිබඳව කෙටි සටහන් ලියන්න

1. ආදී පීතෘ ආබ්‍රහම්තුමා කැඳවීම මගින් අප ලබන ආදර්ශ
2. දේව කැඳවීමට කීකරු වෙමු
3. ශුද්ධාත්ම ඵල වර්ධනය කරගනිමු
4. දසපනත පිළිපදිමු

# පිළිතුරු පත්‍රය

## 8 ශ්‍රේණිය　　　　　　　　　　　　ක්‍රිස්තු ධර්මය

## I කොටස

| | | | |
|---|---|---|---|
| 01 - 2 | 06 - 2 | 11 - 4 | 16 - 2 |
| 02 - 2 | 07 - 4 | 12 - 3 | 17 - 1 |
| 03 - 3 | 08 - 4 | 13 - 1 | 18 - 3 |
| 04 - 4 | 09 - 3 | 14 - 1 | 19 - 2 |
| 05 - 3 | 10 - 3 | 15 - 3 | 20 - 1 |

2x20 - 40

## 2 කොටස

1. 1. පුහුණු කර යවනු ලැබූවන්
   2. මතෙව් නොහොත් ලෙවී
   3. ප්‍රේමය ප්‍රීතිය සාමය ඉවසීම කරුණාව
   4. හාරාන්
   5. කීකරුකම, අචල ඇදහිල්ල
   6. මාර්තා සහ මරියා
   7. (61) පිටුව නිරතුරුව යාච්ඤාවේ යෙදිය යුතුයි /දෙවියන් වහන්සේ සමග ගැඹුරු සම්බන්ධතාවක් පවත්වා ගත යුතුයි සාමූහික ජීවත්වීමට යොමුවිය යුතුයි
   8. (62) පිටුව දේවමෙහෙයන් සඳහා බැතියෙන් සහභාගීවීම/ නිති පතා යාච්ඤා කිරීම/ අපට ලැබෙන වගකීම් උද්යෝගයෙන් හා දිරිමත්ව ඉටු කිරීම
   9. ජායිරස්ගේ දියණිය මළවුන්ගෙන් නැගිටුවීම/ නායින් නුවර වැන්දඹුවගේ පුතා මළවුන්ගෙන් නැගිටුවීම
   10. කීකරුකම /දයාව /ආදරය /ප්‍රේමය /කරුණාව/ ඉවසීම ආදී පිළිතුරු

2x10 - 20

2. 1. දිවා කාලයේ - වලා ටැඹ
   රාත්‍රී කාලයේ - ගිනි ටැඹ　　(ල 2)
   2. මන්නා සහ වටුවන්　　(ල 3)
   3. සුදුසු පිළිතුරට ලකුණු දෙන්න　　(ල 5)

3. 1. වෙහෙස වන්නා වූ බර උසුලන්නා වූ සියල්ලෙනි මා වෙත එන්න මම ඔබට සහනය දෙන්නෙමි　　(ල 2)
   2. සාකෙවුස් / සමාරිය ස්ත්‍රිය / රෝගීන්　　(ල 3)
   3. සුදුසු පිළිතුරට ලකුණු දෙන්න　　(ල 5)

4. 1. උපදෙස් දීමේ ප්‍රඥාව / ධර්මය පහදා දීමේ ඥානය / ආත්මයාණන් තුළ විශ්වාසය / සුව කිරීමේ වරම හාස්කම් කිරීමේ බලය / දිව්‍යස් වැකි කීමේ බලය / ආත්ම විමසීමේ හැකියාව (47) පිටුව　　(ල 2)
   2. සුදුසු යාච්ඤාවට ලකුණු දෙන්න (රෝගී අවස්ථාව පිලිබඳවත් ඒ සඳහා මග පෙන්වීමත් වෛද්‍යවරුන් හා උපස්ථායකයින් පිලිබඳවත් යාච්ඤාව තුළ අඩංගු විය යුතුයි)　　(ල 3)
   3. සුදුසු පිළිතුරට ලකුණු දෙන්න　　(ල 5)

5. 1. දුවිල්ල / ජීවන හුස්ම හෙළීම　　(ල 2)
   2. දේව ස්වරූපය අනුව මැවීම / තමන් වහන්සේට සමාන ලෙස මනුෂ්‍යයා මැවීම
   3. සුදුසු පිළිතුරට ලකුණු දෙන්න　　(ල 5)

6. 1. ගීතාවලිය (23) රැළ පෝෂණය කිරීම / රැකවරණය / අතරමං වී සිටින බැටළුවන් මුදවා ගැනීම / සුවය සැලසීම　(ල 2)
   2. රැළ පෝෂණය කිරීම - පන්දහසකට කෑම දීම
   මග මගපෙන්වීම - උපමා හා දේශන මගින්
   රැකවල් කිරීම ආරක්ෂා කිරීම - රෝගීන් සුව කිරීම්　　(ල 3)
   3. සුදුසු පිළිතුරට ලකුණු දෙන්න　　(ල 5)

7. 1. (20) පාඩම
   2. (5) පාඩම
   3. (11) පාඩම
   4. (19) පාඩම

(5x2)